# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2316/01 - 2023 ජනවාරි මස 23 වැනි සඳුදා - 2023.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කෑගල්ල නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතුකොට ගෙන කෑගල්ල නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කෑගල්ල නගර සභාවේ අංක 10 - පිටිහුම කොට්ඨාසයට තේරී පත් වූ වර්ණකුලගේ ඉෂාර රන්ධික හරිස්චන්ද්‍ර අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කෑගල්ල නගර සභාවේ අංක 10 - පිටිහුම කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සිරිමෙවන් පාලිත විජේවර්ධන නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කෑගල්ල නගර සභාවේ තේරීම්භාර නිලධාරී කස්තුරිසිංහ හේරත් මුදියන්සේලාගේ සජිත් ප්‍රියංකර කස්තුරිසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් සිරිමෙවන් පාලිත විජේවර්ධන, කෑගල්ල නගර සභාවේ අංක 10 - පිටිහුම කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. එච්. එම්. සජිත් පී. කස්තුරිසිංහ,**
තේරීම්භාර නිලධාරී,
කෑගල්ල නගර සභාව.

2023 ජනවාරි මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කෑගල්ල.

EOG 01-0217